EVENT

# ඩොමිගේ මිනිබිරියගේ විවාහ සංවත්සරය ඕස්ට්‍රේලියාවේ



නැසී ගිය ජනප්‍රිය සිනමා නළු ඩොමී ජයවර්ධනගේ මිනිබිරියක වන (නිහාල් ජයවර්ධනගේ බාල දියණිය) හර්ෂා ජයවර්ධන සහ නැසී ගිය හිටපු නියෝජ්‍ය අමාත්‍ය අතුල නිමලසිරි ජයසිංහගේ බෑනනුවන් වන (ලොකු අතුල) සඳුන් සේනාධීරගේ 15 වන විවාහ සංවත්සරය පසුගියදා ඕස්ට්‍රේලියාවේදී පැවැත්වූයේ එහි පදිංචි කලාකරුවන්ගේ සහභාගීත්වයෙන්. සඳුන් එහි ව්‍යාපාරිකයෙකි. හර්ෂා, දිනේෂ් ප්‍රියසාද්ගේ කොලොම්පූර් චිත්‍රපටයේ ප්‍රධාන චරිතයක් රඟපෑ අතර ළමා හඬකැවීම් ශිල්පිනියක ලෙසද කලක් කටයුතු කළාය.











# කැලුම් සියත TV අධ්‍යක්ෂ ධූරයට

ප්‍රවීන චිත්‍රපට හා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරයකු හා නිෂ්පාදකවරයකු වන කැලුම් පාලිත මහීරත්න, සියත TV නාලිකාවේ අධ්‍යක්ෂවරයකු ලෙස වැඩ බාර ගත්තේය. වසර 30ක පමණ කාලයක් රූපවාහිනී ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති කැලුම්, ජාතික රූපවාහිනියේ වැඩසටහන් නිෂ්පාදකවරයෙකු මෙන්ම ස්වර්ණවාහිනියේ වැඩ සටහන් අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත.

එළඹෙන අගෝස්තු මාසයේ සියත TV නව ආරකින් නැවත එළි දැක්වීමට නියමිත අතර සියලුම වැඩසටහන් කැලුම්ගේ අධීක්ෂණය මත සිදුවෙමින්, නැවුම් උසස් රස වින්දනයක් ප්‍රේක්ෂකයාට ලබා දීම ඔහුගේ අරමුණයි.

# අයෝමි නැවතත් රංගනටය

අයෝමි ශානිකා කාගේත් ආදරය දිනා ගත්ත රංගන ශිල්පිනියක්. පහුගිය කාලයේ ඈ පුංචි තිරයේ අපි දැක්කේ නැත්තේ පුංචි පුතෙක්,ඇගේ උණුහුමේ සුව විඳි නිසා. දැන් පුතාට වයස අවුරුද්දයි මාස 3යි. අයෝමි දැන් ආයෙමත් රඟපාන්න සූදානම්.

පුතා ටිකක් ලොකු නිසා ආමෙත් රඟපානවා. ලබන මාසේ සිවා අයියගේ වැඩකට එකතු වෙනවා. ඒක මගේ යාලුවෙක් කරන්නේ. යාලුකම නිසා නෙවෙයි. මගේ චරිතෙටත් මම කැමතියි. එහෙම කියලා නිතර රඟපාන්නේනම් නෑ. Husbandගේ event management company එකේ වැඩවලටත් උදව් කරනවා වගේම මගේ ආයුර්වේද ක්ලිනික් එකේත් වැඩත් තියෙනවානේ. ඒ නිසා ඒ දේවල් අතපසු නොවෙන විදිහට හොඳ නිර්මාණයක් ලැබුනේත් රඟපානවා.

